# තුනී පොලිතීන් තහනම, පරිසර සුරැකුම සහ අපේ යුතුකම

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි
සභාපති- මධ්‍යම පරිසර අධිකාරිය

නූතන මානව පරපුරේ දෛනික කාර්යාවලිය පහසු කරලීම සඳහා නිෂ්පාදිත බොහෝ මෙවලම් මඟින් එම මූලික අරමුණ ඉටු වුණත්, ඒවා මඟින් පරිසර විනාශයට ප්‍රබල දායකත්වයක් ලැබීම අනපේක්ෂිත දෙයක් විය. කෙටි කාලීනවත් දිගුකාලීනවත් ස්වභාවික පරිසරයට මෙන්ම මිනිසා ඇතුළු විවිධ වූ සත්ත්ව ප්‍රජාවන්ටත් එමගින් ඉතා හානිදායක බලපෑම් එල්ල වන්නට වී ඇත. තුනී පොලිතීන් භාවිතය මෙහිදි ප්‍රමුඛත්වයට පත්ව ඇති අයුරු සාමාන්‍ය එදිනෙදා භාවිතය මගින් මෙන්ම විශ්ව විද්‍යාල ඇතුළු විවිධ වූ පර්යේෂණ කණ්ඩායම් මගින් ද තහවුරු කොට ඇත. මෙම තත්ත්වයන් පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රායෝගික ව කරන ලද විමර්ශනයන් මඟින් ලබාගත් තොරතුරු පදනම් කර ගනිමින්, එවකට පරිසර ඇමතිතුමන් වශයෙන් කටයුතු කළ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් තුනී පොලිතීන් තහනම් කිරීමේ අවශ්‍යතා අවධාරණය කරන ලදී.

මෙම ලිපියේ මූලික අවධානය යොමු කරන පරිසර සංරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව අවධාරණය කරන විට දී පැහැදිලි වනුයේ පරිසරය සංරක්ෂණය කරන්නට නම් දැනට පවත්නා පරිසර සංරක්ෂණ ක්‍රමෝපායන් ප්‍රතිපත්තිමය වශයෙන් මෙන්ම ප්‍රායෝගික වශයෙන් ද තවදුරටත් ශක්තිමත් කළ යුතුව ඇත. එහිදී ඝන අපද්‍රව්‍ය මෙන්ම පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා හිමිවනුයේ ප්‍රමුඛස්ථානයකි. මූලික වශයෙන් සදහන් කරන්නට යෙදුණු තුනී පොලිතීන් වෙළඳපොළෙන් බොහෝදුරට නොමිලේ ලැබෙන නිසාත්, පරිභෝජනය ඉතාමත් පහසු නිසාත් මේවා භාවිතයෙන් පසු අක්‍රමවත් ආකාරයෙන් බැහැර කිරීම නිසා පරිසරික වශයෙන් මෙන්ම සමාජයීය වශයෙන් ද හානිදායක තත්ත්වයක් කාලාන්තරයක් තිස්සේ සිදුවෙමින් පවතී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2015 වර්ෂයේ දී මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් කැලණිය විශ්ව



විද්‍යාලය විසින් කරන ලද එම සමීක්ෂණය මගින් තුනී පොලිතීන් භාවිතාව පිලිබඳව නිවැරදි තොරතුරු හඳුනාගැනීමක් සිදුකරන ලදී.

එම වාර්තාවට අනුව ෂොපින් බෑග්, කෑම ඔතන දවටන හෙවත් ලන්ච් ෂීට් මිලියන 15 ක් පමණ දෛනික ව වෙළඳපොළට එකතුවන බව අවධාරණය කර ඇත. මෙවැනි තුනී පොලිතීන් පරිසරයට එකතු වූ පසුව දිරාපත් වීම සඳහා වසර සිය ගණනක් ගතවීමත් බරපතල පාරිසරික ප්‍රශ්නයකි. මේවා මහපොළොවට එකතු වූ පසුව පාංශු සංරක්ෂණ කාර්යයට දායක නොවී පසට හානිගෙන දීමට හේතු වීම, කෘෂිකාර්මික පදනමක් සහිත රටකට බරපතල ප්‍රතිඵල ඇති කරන්නකි. මේ තත්ත්වය ඇති කරන තුනී පොලතීන් පහසුවෙන් කිසිම ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළකට ග්‍රහණය කර ගත නොහැකි වීමත් එහි පාරිසරික හානිය තවදුරටත් ප්‍රබල කිරීමටත් හේතු පාදක වී ඇත.



ඒ අනුව ජාතික පාරිසරික පනතේ නෛතික ප්‍රතිපාදන යටතේ ඝනත්වයෙන් මයික්‍රෝන 20ට අඩු තුනී පොලිතීන් තහනම 2006 ඔක්තෝම්බර් 10 දින අංක 1466/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් තහනම් කරන ලදී. ඒ වන විට තුනී පොලිතීන් නිෂ්පාදනය හා පරිභෝජනය යන ක්ෂේත්‍ර මෙරට අතිශයින් ජනප්‍රිය ව පැවැතීමත්, සාමාන්‍ය පාරිභෝගික ජනතාව ඉතා පහසු පරිශීලන භාණ්ඩයක් ලෙසින් මෙය විවිධ අවශ්‍යතා වෙනුවෙන් භාවිතා කිරීමත් නිසා අදාළ නෛතික ප්‍රතිපාදනය කෙරෙහි සමාජයේ පුළුල් ප්‍රතිචාරයක් ක්‍රියාත්මක වුයේ නැත. පසුකාලීනව මෙම තත්ත්වය හා ඒවා භාවිතාවේ හානිදායක තත්ත්වය යළිත් වරක් අවධාරණය කරමින් වත්මන් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යතුමන් මෙන්ම අතිගරු ජනාධිපතිතුමන් වන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසින් තුනී පොලිතීන් තහනම සමාජය තුළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව විශේෂයෙන් අවධාරණය කරන ලදී. ඒ අනුව 2016 ජනවාරි 1 වනදා පටන් මයික්‍රෝන 20ට අඩු කාණ්ඩයට අයත්වන ෂොපින් බෑග්, ග්‍රොසරි බෑග් හා කෑම ඔතන දවටන හෙවත් ලන්ච් ෂීට් ආදිය නිෂ්පාදනය යන කටයුතු තහනම් කරන ලදී.

එසේ වුවත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් තුනී පොලිතීන් තහනම පිළිබඳවත්, ඒවා අවභාවිතයෙන් ඇතිවන හානිදායක තත්ත්වයන් පිළිබඳවත් විවිධ වූ ක්‍රමවේද මගින් ජනතාව දැනුවත් කිරීමෙන් පසුව තුනී පොලිතීන් නිෂ්පාදකයින් හා අලෙවිකරන්නන් සොයා වැටලීම් කරන ලදී. එහිදී නීති විරෝධි අයුරින් ලන්ච් ෂීට්, ෂොපින් බෑග්, ග්‍රොසරි බෑග් වැනි මයික්‍රෝන 20ට වඩා අඩු ඝනත්වයෙන් යුත් තුනී පොලිතීන් නිෂ්පනාදකයින් මෙන්ම අලෙවිකරන්නන් හසු වූ අතර ඔවුන් නීතිය හමුවට ඉදිරිපත් කොට ඇත. අදවන විට පොලිතීන් නිෂ්පාදනය කරන්නන්ටත්, අලෙවිකරුවන්ටත් විරුද්ධව මධ්‍යම පරිසර අධිකාරිය විසින් නීතිමය පියවර ගෙන ඇත.

ව්‍යාපාරිකයින් අතලොස්සක් විසින් ඉතා සූක්ෂම ආකාරයෙන් මෙම තුනී පොලිතීන් නිෂ්පාදනය කරමින් වෙළඳපොළට නිකුත් කිරීම හේතුවෙන් තවදුරටත් වෙළඳපොලේ මෙම නිෂ්පාදනයන් පැවැතීම වාර්තා වී ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය මගින්, පාරිභෝගික සේවා අධිකාරියේ සහ පරිසර පොලිස් ඒකකයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් විමර්ශන කණ්ඩායමක් මගින් දිගින් දිගටම 2015 වර්ෂයේ පටන් තුනී පොලිතීන් වැටලීම් කරන ලදී. මෙම පොලිතීන් වර්ග තොග වශයෙන් බෙදා හරින කොළඹ තොග වෙළඳසැල් හා සුපර් මාර්කට් වැනි විශාල වෙළඳ සැල් රාශියක මෙම වැටලීම් කරමින් නීති විරෝධී අයුරින් ඒවා අලෙවි කරන්නන් නීතියේ රැහැනට අල්ලා ගන්නා ලදී.

කොළඹ නගරයේ ස්ථාන රාශියක හා තදාසන්න ප්‍රදේශවලත් තුනී පොලිතීන් අලෙවිකරන්නන් සොයා වැටලීම් සිදුකළ අතර, නිෂ්පාදනය කරනු ලබන කම්හල් වැටලීම් වලදීත්, ඒවා නිෂ්පාදනය කරන්නන්ද අල්ලා ගැනීමට හැකි විය. මුදලින් දඩ ගැසීම් සමගින් තවදුරටත් එම නිෂ්පාදනයන්ගෙන් වැලකීමේ ජාතික අවශ්‍යතාවය පිළිබඳව ඔවුන් වෙත තොරතුරු සන්නිවේදනය

කිරීම සිදුකරන ලදී. මීට සමගාමීව තුනී පොලතීන් භාවිතය වෙනුවට පරිසර හිතකාමී වූ විකල්ප භාවිතයන්හි අවශ්‍යතාව පිළිබඳව රූපවාහිනිය, ගුවන් විදුලිය මගින් මෙන්ම පුවත්පත් නිවේදන, දැන්වීම් හා ලිපි මගින් ද කරුණු අවධාරණය කරන ලදී. තවදුරටත් වරින් වර ඒ පිළිබඳව මාධ්‍ය මගින් තොරතුරු සන්නිවේදනය කිරීම කරමින් පවතී.

ශ්‍රී ලාංකීය අනාගත පුරවැසියන් පරිසර හිතකාමීන් බවට පත්කරලීම වෙනුවෙන් ඉතා පුළුල් දැක්මක් මත ක්‍රියාත්මක කරනු ලබන ජාතික පරිසර නියමු වැඩසටහන යටතේ පොලිතීන් සඳහා විකල්ප ක්‍රමවේද පිළිබඳව සමස්ත පාසල් ප්‍රජාව දැනුම්වත් කිරීමේ පුළුල් වැඩසටහනක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.

ඒ අනුව මේවන විට විශේෂයෙන් පරිසර නියමු වැඩසටහන ක්‍රියාත්මක කරන පාසල් බොහෝමයක් පොලිතීන් භාවිතයෙන් තොර කලාප බවට පත්කර ඇත. මේවා භාවිතයේ සැබෑ ආදීනව පිළිබඳව පරිසර නියමුවන් නියමාකාරයෙන් අවබෝධ කරගෙන ඇතත්, වැඩිහිටි බොහෝ පිරිස් මේ ව්‍යසනයේ අනතුරු පිළිබඳව අප කොතරම් කරුණු අවධාරණය කළත් නිසි ලෙස අවබෝධ කර නොගැනීම තවදුරටත් ප්‍රශ්නයක් ව ඇත.

අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් අපේ මාතෘභූමියේ පරිසර සුරැකුම වෙනුවෙන් මහත් ඕනෑකමින් හා ඒ පිළිබඳව සැබෑ හැඟීමකින් යුක්තව අතිගරු ජනාධිපතිතුමන් නිතර නිතර අවධාරණය කරන පරිදි ඝන අපද්‍රව්‍ය ගැටලුව, විද්‍යුත් අපද්‍රව්‍ය, සායනික අපද්‍රව්‍ය, පසුභාවිත පොලිතින් ප්ලාස්ටික් අපද්‍රව්‍ය ආදීය ප්‍රතිචක්‍රීකරණය සඳහා මේවන විට ඵලදායී වැඩසටහන් ගණනාවක් රටට හඳුන්වා දී ඇත. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු පිළිසරු ව්‍යාපෘතිය හා පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය මෙරට පළාත් පාලන ආයතන සමග ඒකාබද්ධව මේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.

පවිත්‍ර පරිසරයක් නැතහොත් කසළින් තොර පිරිසිදු පරිසරයක් බිහිකිරීමේ දී පොලිතීන් හා ප්ලාස්ටික් වලින් තොර සුන්දර පරිසරයක් ඇතිකිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා දැනට ගෙන ඇති නෛතික ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවේ. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පසුගිය වකවානුව තුළ ලැබූ අත්දැකීම් සහ පාර්ශවකරුවන්ගෙන් ලද තොරතුරු මෙන්ම විවිධ පාර්ශ්වකරුවන් මගින් හෙළිකරගත් තොරතුරු අනුව තවදුරටත් පොලිතීන් ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා නීතිරීති සැකසීම අත්‍යවශ්‍ය වේ. ඒවා අතර,

එම ප්‍රයත්නයේ දී පක්ෂ, පාට හෝ රාජ්‍ය, පෞද්ගලික හෝ වෙනත් පදනමකින් හෝ කිසිවක් සලකන්නේ නැතිව හුදු ගෝත්‍රිකවාදී චින්තනයෙන් මිදී පරිසර සුරැකුම යන පොදු භාවිතය මත අප සියළු දෙනා සංවිධානය වීමේ සමකාලීන සමාජ අවශ්‍යතාව අද අප හමුවේ දැඩිව පෙනී සිටී. ජලය, පස, වායුව, වනාන්තර ඇතුළු පරිසර පද්ධති සමග මිනිසා ඇතුළු සියළු ජීවීන්ගේ පැවැත්ම තහවුරු කරන පරිසරය රැක ගැනීමේ දී එම පොදු අරමුණු වෙනුවෙන් එකම න්‍යාය පත්‍රයක් යටතේ අප ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා අත්‍යවශ්‍ය බුද්ධිමය සම්පත් මෙන්ම භෞතික සම්පත් ද අප සතුව පවතී. අවංක කැපවීම තුළින් එම ඉලක්කයන් ජය ගැනීම කරගත හැකි වනු ඇත. ඒ සඳහා රටේ විධායක ජනාධිපතිතුමන් පරිසර අමාත්‍යධූරය දැරීම වාසනාවක් කොට ගත යුතුය.

